


**Children's Corner**

## අඳුරු වලාව

හිරු සැඟවීලා ලොවට හොරෙන්
නැත ආවේ ඔබ ඒදින උදෙන්
අඳුරු වලා මුළු ලොවම වෙලන්
ඔබ හිටියේ ඇයි නිහඬ බවින්

නිවහන පාළුයි එළියක් නැත එහි
සතුටු සිනා ඇයි සැඟව ගියේ
කණකොක් හඬලා
කරපු වියෝ මෙහි
කොහොමද අප සිත් ඉවසන්නේ

නිවහන තුළ රන් පහනක් නැත අද
අපහට පිය සෙනෙහස අහිමිව ඇත
නෙතට කඳුළ සදහටම හිමිව ඇත
අසරණ තනිකම දිවිය වසා ඇත

**හාසිනී මහේෂිකා විජේකෝන්**
නාලන්දා බාලිකා විදුහල
මිනුවන්ගොඩ Sri Lanka

## මව්පියන්ගෙ අවවාදය

උදෙන් අවදි වෙයන් පුතේ
මුහුණ සෝද ගනින් පුතේ
පොත් පත් හෙම කියවලා
හොඳ මිනිහෙක් වෙයන් පුතේ
ගුරුවරුන්ගෙ යාළුවන්ගෙ
හොඳ ඔවදන් හිතට ගනින්
ලොකු පිරිසට කීකරුවී
ඉන්නා තැන නමක් ගනින්
නිතරම පිළිවෙලට ඉඳන්
බුදුන් දහම් සරණ ගොසින්
තමා ගැනම පමණක් නොව
අනුන් ගැනත් හිතන් පුතේ
බුදු දහමට අනුව ඉඳන්
පසු පවිනුත් වැලකීලා
යහගුණ දම් හිතට අරන්
හොඳ මිනිහෙක් වෙයන් පුතේ

♦ **එස්. මිනෝදි කාංචනා**
කොටපොල නවෝද්‍යා මහ විදුහල
කොටපොල Sri Lanka

**Send your poetry and short essays to this Children's Corner by post, fax or e-mail.**

## The World's Largest School
## ලොව විශාලතම පාසැල

The world's largest school is City Montessori. The mixed - sex private establishment has 26,312 students on 26 campuses in Lucknow, India. It takes pupils from the age of three up to the Indian equivalent of A-levels. It's a far cry from the school's launch in 1959. Then it was in rented premises with only five scholars

අද ලොව ඇති විශාලතම පාසැල සිටි මොන්ටිසෝරි නම් වේ. මිශ්‍ර පාඨශාලාවක් වන එහි ශිෂ්‍ය ශිෂ්‍යාවෝ 26,312 ක් ඉගෙනගනිති. විද්‍යාල 26 කින් සමන්විත මෙම පාසැල පිහිටා ඇත්තේ ඉන්දියාවේ ලක්නව් නගරයේය. එයට 3 වසර සිට ඉහළම පන්තිය වූ අධ්‍යාපන උසස් පෙළ දක්වා සිසුන් ඇතුළත්කර ගන්නා බව පැවසේ. මෙම පාසැලේ අද ඇති දියුණු තත්වය එය 1959 දී ආරම්භ කළාට වඩා හාත්පසින්ම වෙනස්ය. ඒ මුල් අවධියේ මෙය කුලියට ගත් කුඩා ගොඩනැගිල්ලක් වූ අතර, එදා එහි සිටියේ බාලාංශ පන්ති සිසුන් 5 දෙනෙකු පමණි.

♦ *Auntie Ramani ( රමණී නැන්දා)*

## සුන්දර වූ රාත්‍රිය

ඇළ නියරේ හිඳ එළදෙන පැටියට අඬ ගහනවා
නිල්ල පිරුණු වෙල්යායට උඟේ හිත ඇදෙනවා
වෙල මැද්දේ පඹයා දැක පැටියට බය හිතෙනවා
නියර දිගේ පෙරළි පෙරළි අම්ම ළඟට දුවනවා

උඳුපියලිය කොල දිලිසෙයි පිනිබින්දු වැටී
හා පැටවුන් පිනුම් ගහයි එහි රසය දැනී
නිතර නිතර බකුසුහාමි එයි නැගිට යළී
හ්ම් හ්ම් හ්ම් කියා ගී කියයි යළී

තරු කුමරියො හඳ වටේට රංචු ගැහෙනවා
සිහින් සිහින් සිහින් හඬින් ගී මුමුණනවා
ඒ කාලෙට අතු ඉති පොඩි අත්වැල් දෙනවා
රෑ කාලය තාමත් මට මැවී පෙනෙනවා

♦ **සුචිමාලි ජයසිංහ**
සිරිමාවෝ බණ්ඩාරනායක බා. වි.
කොළඹ 7 Sri Lanka


**BOC** ලංකා බැංකුව **BANK OF CEYLON**
ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි

**ලන්ඩන් ශාඛාව**

**ඔබේ මුදල් ගාස්තුවකින් තොරව සුරක්ෂිතව හා විශ්වාසදායකව ශ්‍රීලංකාවට ප්‍රේෂණයකිරිමේ මහඟු අවස්ථාවක් !**

* ලංකා බැංකුවේ ලන්ඩන් ශාඛාව මගින් ශ්‍රීලංකාවේ ලංකා බැංකු ශාඛාවන්හි පවත්වාගෙන යනු ලබන ඕනෑම ගිණුමකට ඔබත් ගාස්තුවකින් තොරව මුදල් ප්‍රේෂණය කරන්න.

* ඔබගේ ඉතුරුම් වෙනුවෙන් ලංකා බැංකුවේ අනේවාසික විදේශ ගිණුමක් (NRFC) ආරම්භකර පවුම් වලින් මුදල් ප්‍රේෂණය කර පහත සඳහන් ප්‍රතිලාභ ලබාගන්න.

1. පවුම් වලින්ම පොළිය ලබාගැනීම.
2. ගිණුමේ ඇති මුදල් නිදහසේ ඕනෑම අයෙකුට හෝ විදේශ රටක ඇති ගිණුමකට ප්‍රේෂණය කිරීමේ හැකියාව.
3. NRFC ගිණුම මාර්ගයෙන් මුදල් ප්‍රේෂණය කිරීමෙන් උපරිම විනිමය අනුපාතිකයක් රුපියල් සඳහා ලබාගැනීමේ හැකියාව.

*ලංකා බැංකුවට පැමිණීමෙන් හෝ* **HSBC, NATWEST, BARCLAYS** *බැංකු වලින් අපගේ පහත සඳහන් රැස්කිරීමේ ගිණුම්වලට මුදල් බැර කිරීමෙන් අනතුරුව අපව අමතන්න.*


| | | |
|---|---|---|
| HSBC | - Sort Code : 40 - 05 - 15 | A/C - 00491624 |
| NatWest | - Sort Code : 60 - 00 - 04 | A/C - 04607732 |
| BARCLAYS | - Sort Code : 20 - 32 - 53 | A/C - 80113859 |

**No 1, Devonshire Square, London EC2M 4WD**
Phone : 020 7377 1888 Fax: 020 7377 5430
e-mail : bankofceylon.uk@btclick.com
Our Web - www.boc.lk
Nearest railway station - Liverpool Street (tube & rail) Bishop Gate Exit


**මා කැමති ඔබ කැමති ✻ ගීයක්**

# අද ඔබට වඳින පුදන ලෝකයම හෙට ඔබට විරුද්ධව නැගිටී !

**මා** ඉතා අගය කරන ගායිකාවක් වන විශාරද නන්දා මාලිනිය ගායනා කරන මා ඉතා ප්‍රියකරන බොහෝ ගීත අතුරෙන් **පූජාසනයේ ඔබ හිඳුවා** යන ගීය ලංකාවිත්ති පත්‍රයේ **මා කැමති ඔබ කැමති ගී** තීරයේ පළකරන්නේ නම් ඉතා කෘතඥ වෙමි. මේ ගීය මා මුලින්ම ඇසුමේ අසූවේ දශකයේදීය. මෙය නන්දා මාලිනියගේ සත්‍යයේ ගීතය නම් ප්‍රසංගයේ දී ගැයූ ගීත අතර තිබුණාසේ මට මතකය. මෙහි පද රචනය ප්‍රවීන ගීත රචක මහාචාර්‍ය සුනිල් ආරියරත්නයන් ගේය. මහාචාර්‍යතුමාගේ බොහෝ පබැඳුම් සේම මෙය ද, ජීවිතයේ යථාර්ථය ශ්‍රාවක රසිකයාට වටහා දීමට ගත් මාහැඟි ප්‍රයත්නයකැයි මට හැඟේ. එසේම ගීතයේ තනුව නිර්මාණයකර එය සංගීතයෙන් රසගැන්වූ සංගීතඥ එච්. එම්. ජයවර්ධන ශූරීන් ද මෙහිදී මතකයට නගන්නේ මෙම ගීතයේ සාර්කත්වයට ඔවුන්ගෙන් වී ඇති දායකත්වය ද ඉමහත් නිසා ය.



*මහාචාර්‍ය සුනිල් ආරියරත්න*



*විශාරද නන්දා මාලිනී*

කියැවෙන අරුත් අනුව කල්පනා කළහොත් මෙයින් අප කාටත් මාහැඟි ඔවදනක්, පාඩමක් සපයන්නේය. මෙහි ආරම්භය අෂ්ඨලෝක ධර්මය බව අපට වැටහේ. ලාභ අලාභ, අයස යස, නින්දා ප්‍රශංසා, දුක සැප යන ධර්මතා අට අනුව අප කාගේත් ජීවිතය ගමන්කරයි. වෙනස් වෙමින් පවතී. මෙයින් බැහැරව කිසිවක් සිදු නොවේ. එසේම මෙවැනි තත්වයක් යටතේ කිසිවක් සහතික ද නැත. තත්වයන් එකාකාරවම දිගටම පවතීයයිද සිතිය නොහැක. එහෙත් මිනිස් කම ඒ අයුරින් සිතන්නට ඉඩ නොදේ. මක්නිසාද අපේ ආශාවන් හා බලාපොරොත්තු අධික නිසාය. මේ කාරණය නිසාම නොසිතූවක් සිදු වූ කල මිනිසා අතිශය කම්පාවට පත්වෙයි. අට ලෝ දහම ගැන ඇති නොදැනුවත්කම මගින් බලාපොරොත්තු කඩ වූ තැනැත්තා ඉතා දුකට පත්වෙයි. හඬා වැලපෙයි.

මේ ලෝකය ක්‍රියාකරන ආකාරය මෙහි ජීවත්වන අප වටහාගත යුතුය. ප්‍රශංසාව ළඟම නින්දාවද තිබෙනු හැකිය. අද අපව හිනස්සන ලෝකයා හෙට අපව හඬවනවා ඇත. ඒ නයින්ම අද ප්‍රශංසා කරන අයම හෙට අපහාස ද කරනවා ඇත. මෙය ඒකාන්තයෙන්ම හැම විටම සිදු නූනත් බොහෝ විට එසේ වීමට ඉඩ තිබේ. එසේ නොවීමට නම් අප සැහෙන්න පරෙස්සම් විය යුතුය. මධ්‍යස්ත ජීවිතයක් ගත කළ යුතුය. කීර්තිය ප්‍රශංසාව හා යසස පසුපස හඹායාම නිරර්ථක එලොවට මෙලොවට වැඩක් නැති පුහු දේ බව වටහාගත යුතුය.

මේ ගීතයෙන් ද්වනිත අර්ථය සැබෑ කරවන දෙයක් වර්තමානයේ අප රටේ සිදුව ඇති බවත්, තවමත් අප ජනතාව ඒ ගැන කතා කරනවාත් කම්පා වෙනවාත් අපි දනිමු. වීර යෙක් ලෙස බොහෝ දෙනා පිළිගෙන, බුහුමන් කළ කෙනෙකු වැඩි කල් නොගොස්ම වීරත්වයෙන් ගිලිහී ඒ බුහුමන් කළ අයගේම ගැරුහුමට පාත්‍රව දැන් සිරබාරයට පත්ව සිටී. මෙය දෛවයේ සරදමක් යයි ඇතැම් අය කියතත් මෙය ඉහතකී අටලෝ දහමේ ප්‍රතිඵලයක් නොවේද? එසේම ඒ දෙස තවත් තීක්ෂණව බැලුවහොත් එය අනුවණකම නිසාම ඒ චක්‍රය ඉබේ කරකැවී එන්නට පෙරාතුවම බලයෙන් ඇද තමා වෙතට කරකවා ඇද ගැනීමක් බව මට නම් පෙනේ. එය හරියටම යන්ත්‍රයක ක්‍රියා කාරිත්වය නොදන්නා කෙනෙකු සිය අනුවණකම නිසාම යන්ත්‍රයේ යම් යම් කොටස් අතපත ගාන්නට හෝ තාක්ෂණය වෙනස් කරන්නට හෝ ගොස් යන්ත්‍රයේ ක්‍රියාකාරිත්වය විරුද්ධ අතට හැරී ඒ පුද්ගලයා මහා අනතුරකට භාජනය වෙනවා වැනි දෙයකි. නුවණැති පුද්ගලයෝ එසේ නොහැසිරෙති. ඔව්හු සමාජ නීති හා සම්මත චර්‍යාය ධර්ම ගරු කරති. එසේ ම තම ගෞරවයට හානිවන දෑ නොකරති. අට ලෝ දහම අනුව විපාක හඳුනාගෙන දැහැමෙන් ජීවත්වෙති.

♦ **විස්කම් සෙනෙවිරත්න**
*යක්කල* Sri Lanka

පූජාසනයේ ඔබ හිඳුවා
ඔබට පුදන මේ ලෝකයමයි හෙට
ඔබට එරෙහි වී නැගිටින්නේ

ඉසුරෙන් කිත් යසසින් බබළන දා
ඔබගේ බැණුමත් ගියක් වේ
ඉසුරෙන් කිත් යසසින් පිරිහුණ දා
සිනාසුනත් එය වරදක් වේ

කිරියෙන් පැණියෙන් උතුරා යන කල
ලොව ඔබ පාමුළ හඬා වැටේ
අතමිට හිඟ වී බෙලසුන් වන කල
ලොව ඔබ හිස මත කඩා වැටේ

පූජාසනයේ ඔබ හිඳුවා
ඔබට පුදන මේ ලෝකයමයි හෙට
ඔබට එරෙහි වී නැගිටින්නේ

ගායනය - *විශාරද නන්දා මාලිනී*
ගී පද - *මහාචාර්‍ය සුනිල් ආරියරත්න*
තනුව හා සංගීතය - *එච්. එම්. ජයවර්ධන*


**Srilanka Information Sites ශ්‍රී ලංකා තොරතුරු අඩවි**
www.srilankans.com www.srilankatours.co.uk www.srilanka-holidays.co.uk